# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2019

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග

(Business Management and strategy)

මෙම ප්‍රශ්න පත්‍රය A, B, C, D යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20 කි.

අංක 1.1 සිට අංක 1.5 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන, තෝරාගත් උත්තරයට අදාල අංකය පමණක් උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. විෂය නිර්දේශයෙහි බොහෝ කොටස් ආවරණය වන ලෙස සකසා ඇති මෙවැනි ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී ලබා දී ඇති කාලය කළමනාකරණය කර ගැනීම පිළිබඳව අයදුම්කරුවන් අවබෝධයෙන් කටයුතු කළයුතු අතරම උත්තර සැපයීමේදී දී ඇති උපදෙස් නිසිපරිදි අවබෝධ කරගෙන උත්තර සැපයීම කළ යුතුය. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උපදෙස් පිළිපැද උත්තර ඉදිරිපත් කර තිබුණද සුළු අයදුම්කරුවන් පිරිසක් තෝරාගත් උත්තරය උත්තර පත්‍රයේ නැවත ලියා, තිබීම ද නිරීක්ෂණය විය. තවද පහසුවෙන් ලකුණු ලබාගැනීමට හැකි ප්‍රශ්නයක් වුවත් උත්තර ලිවීම මගහැර ඇති අවස්ථාද දක්නට ලැබුණි.

ප්‍රශ්න අංක 1.6 සිට 1.10 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රශ්න අංකය සමඟ උත්තර පත්‍රයේ ලිවීමට නියමිතව තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථකව උපදෙස් අනුගමනය කරමින් උත්තර ලියා තිබූ අතර, සුළු පිරිසක් සත්‍ය අසත්‍ය වෙනුවට "√" සහ "x" ලකුණු යොදා දක්වා තිබුණි. 1.8 සහ 1.9 කොටස් සඳහා සමහරක් අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලියා නොතිබුණි. අයදුම්කරුවන් විකේතනය (decoding) යන්න පිළිබඳව අවබෝධයක් නොතිබුණි. එසේම පහළට ක්‍රියාත්මක වන සන්නිවේදනය, ඉහළට ක්‍රියාත්මක වන සන්නිවේදනය සමඟ පටලවාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න පහකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 කි. මෙම ප්‍රශ්න 5 සඳහා අයදුම්කරුවන් බහුතරයගේ කාර්යසාධනය ඉතා අඩු මට්ටමක තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්න කිහිපයකට කිසිම උත්තරයක් ලියා නොතිබුණි.

### ප්‍රශ්න අංක 02

සම්ප්‍රදායක කළමනාකරණ න්‍යායෙහි සේවක කණ්ඩායම් ව්‍යුහගත කිරීමේදී කළමනාකරුවන් විසින් අනුගමනය කළ යුතු මූලධර්ම 14 ක් හෙන්රි ෆෙයොල් විසින් හඳුන්වා දී ඇති අතර, ඉන් කළමනාකරණ මූලධර්ම 2 ක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. පොදුවේ ගත්කළ බොහෝ අයදුම්කරුවන් මේ සඳහා අදාළ මූලධර්ම 2ක් ඉදිරිපත් කර ඒවා පැහැදිලි කර තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් කළමනාකරණ ක්‍රියාවලිය වන සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම යන කරුණු ඉදිරිපත් කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් ශ්‍රම විභජනය යන මූලධර්මය වෙනුවට විශේෂීකරණය සහ අභිප්‍රේරණය පිළිබඳව කරුණු දක්වා තිබුණි. තවත් සමහරක් අයදුම්කරුවන් අධිකාරිය සහ වගකීම එක් මූලධර්මයක් වුවත් එය කරුණු දෙකක් ලෙස වෙනවෙනම ඉදිරිපත් කර තිබුණි. තවද මූලධර්ම නිශ්චිතව හඳුනාගත් අයදුම්කරුවන්ද ඒවා පැහැදිලි කිරීමේදී නිසිලෙස පැහැදිලි කර නොතිබුණි. මෙම ප්‍රශ්නය ඉතා සරල සහ නිශ්චිත උත්තරයක් තිබෙන නිසා ලකුණු ලබාගැනීමට ඉතා පහසු ප්‍රශ්නයකි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

ජපන් කළමනාකරණ ශෛලිය ආශ්‍රිත ප්‍රධාන පරිචයන් (key practices) 5 ක් සඳහන් කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. අයදුම්කරුවන් බහුතරයක් මේ සඳහා සාර්ථක උත්තර ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රශ්නය පිළිබඳව දැනුවත්භාවයේ අඩුවක් දක්නට ලැබුණි. සිසුන් ඒ පිළිබඳව නිසි අවබෝධයකින් තොරව උත්තර සපයා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් 5s, Kiezen වැනි ක්‍රම පිළිබඳව දීර්ඝව ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම කරුණු 5 ක් සඳහන් කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබියදී අනවශ්‍ය දීර්ඝ විස්තර ඉදිරිපත් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. බොහෝ අයදුම්කරුවන් ජපන් කළමනාකරණය පිළිබඳ අවබෝධය නොමැති බව තහවුරු වූ අතර, බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීම මගහැර තිබූ බව අනාවරණය විය. ප්‍රශ්නයට අදාල ලෙස නිසි උත්තර ඉදිරිපත් කර තිබුණේ ඉතාමත් සීමිත කොටසකි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් දුර්වල විය.**

## ප්‍රශ්න අංක 04

පාලන ක්‍රියාවලියේ පියවරයන් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. අයදුම්කරුවන්ට මේ පිළිබඳව දැනුම අඩු මට්ටමක පැවති බව ඉදිරිපත් කර තිබූ උත්තරවලින් පැහැදිලි විය. ඇතැම් අයදුම්කරුවන් පාලන ක්‍රියාවලියේ පියවරයන් වෙනුවට තීරණ ගැනීමේ පියවරයන් ඉදිරිපත් කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ඇතැම් අය කළමනාකරණ ක්‍රියාවලිය එනම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය යන කරුණු දීර්ඝ ලෙස විස්තර කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් පාලන ක්‍රියාවලියේ පියවරයන් නිසිලෙස ලියා තිබුණත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

සංවිධානයක සඵලදායි සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ක්‍රම දෙකක් පැහැදිලි කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. ක්‍රම දෙකක් නම්කර ඒවා කෙටියෙන් විස්තර කිරීම මුළු ලකුණු ලබාගැනීමට ප්‍රමාණවත් වේ. ප්‍රශ්නයෙන් අසා ඇත්තේ කුමක්ද යන්න පිළිබඳව නිසිපරිදි අවබෝධයක් ලබා තිබූ අයදුම්කරුවන් පමණක් සාර්ථකව උත්තර ලියා මුළු ලකුණු ලබාගෙන තිබූ බව අනාවරණය විය. බොහොමයක් අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නය සඳහා ලබාගත් ලකුණු අඩු මට්ටමක පැවතීමට හේතු වූයේ අනවශ්‍ය ලෙස දීර්ඝ විස්තර එනම් සංස්කෘතියේ වැදගත්කම, සංස්කෘතික ජාලය, හොඳ සංස්කෘතියක ලක්ෂණ වැනි ප්‍රශ්නයට අදාල නොවන දෑ ඉදිරිපත් කර තිබීමයි. ඇතැම් අයදුම්කරුවන් සංස්කෘතිය පිළිබඳව තමා දන්නා සියලුම කරුණු මෙහි උත්තර සඳහා ඇතුලත් කිරීමට උත්සාහ කර තිබුණි. එසේම ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා කිසිදු උත්තරයක් ලියා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාම දුර්වල මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

නියෝජ්‍යත්ව න්‍යාය සහ භාරකාරත්ව න්‍යාය අතර වෙනස්කම් 5 ක් සඳහන් කරන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් ලබා දී තිබූ උත්තර ඉතාමත් අසාර්ථක බැවින් ලකුණු ලබා ගැනීමත් ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය. උත්තර ලිවීම මගහැර සිට සංඛ්‍යාවද ඉහළ මට්ටමක පැවතුණි. උත්තර ඉදිරිපත් කර තිබූ අය අතුරෙන් නිවැරදිව සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණේ ඉතා සුළු පිරිසකි. ඊට හේතුව වන්නේ මේ පිළිබඳ සාර්ථක පරිශීලනයන් කර නොමැති බවයි නැතහොත් හෝ ප්‍රශ්නය අවබෝධ කර නොගැනීමයි. උත්තර ඉදිරිපත් කළ ඇතැම් අයදුම්කරුවන් මෙම න්‍යායයන් දෙක පිළිබඳව ඉදිරිපත් කළ යුතු කරුණු මාරුකර ඉදිරිපත් කළ අවස්ථාද නිරීක්ෂණය විය. එනම් නියෝජ්‍යත්ව න්‍යායට අදාල කරුණු භාරකාරත්ව න්‍යාය යටතේ දක්වා තිබුණි. සමහරක් අයදුම්කරුවන් වෙනස්කම් වෙනුවට නියෝජ්‍යත්ව න්‍යාය වෙනමත් භාරකාරත්ව න්‍යාය වෙනමත් විස්තර කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාම දුර්වල මට්ටමක විය.**

# C කොටස

මෙම කොටස සඳහා ප්‍රශ්න අංක 7 සිට 9 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගතහැකි මුළු ලකුණු ප්‍රමාණය 30 කි. සමස්තයක් ලෙස මෙම කොටසෙහි කාර්යසාධනය සාර්ථක මට්ටමක තිබුණි.

## ප්‍රශ්න අංක 07

සංවිධාන ක්‍රියාවලිය සම්බන්ධයෙන් යොමු කර තිබූ මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විතය. මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** සංවිධානයක් සඳහා සඵලදායී සංවිධානකරණ ක්‍රියාවලියක් වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු 3 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබූ අතර, ප්‍රශ්නයේ **(b) කොටසින්** න්‍යාස (matrix) සංවිධාන ව්‍යුහයක වාසි 2 ක් සහ අවාසි 2 ක් සඳහන් කරන ලෙස දක්වා තිබුණි.

මෙහි **(a) කොටස** සඳහා බොහොමයක් අයදුම්කරුවන් සඵලදායී සංවිධාන ක්‍රියාවලියක වැදගත්කම දක්වමින් කරුණු පැහැදිලි කර උත්තර සාර්ථකව ඉදිරිපත් කර තිබුණි. තවද ඇතැම් අයදුම්කරුවන් උත්තර ලිවීමේදී ප්‍රශ්නයට කුමක් හෝ ලිවීමට උත්සාහාගෙන තිබූ නමුත් සඵලදායී සංවිධාන ක්‍රියාවලියේ වැදගත්කම පැහැදිලි නොකර අදාල නොවන දීර්ඝ විස්තර ඉදිරිපත් කර තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් වැදගත්කම වෙනුවට සංවිධානකරණය පිළිබඳව විස්තර කර තිබුණි. එසේම සමහරක් අයදුම්කරුවන් වැදගත්වීමට හේතු හඳුනාගෙන තිබුණද ඒවා විස්තර කර නොතිබුණි. සමස්ථයක් වශයෙන් මෙම කොටස සඳහා ලකුණු ලබාගැනීම සාර්ථක මට්ටමක පැවති බව අනාවරණය විය.

ප්‍රශ්නයේ **(b) කොටස** සඳහා උත්තර ලිවීමට බොහෝ අයදුම්කරුවන් පිරිසක් මගහැර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. ඇතැම් අය උත්තර ඉදිරිපත් කර තිබුණද නිවැරදිව වාසි සහ අවාසි සඳහන් කර නොතිබුණි. එසේම න්‍යාස සංවිධාන ව්‍යුහය වෙනුවට වෙනත් සංවිධාන ව්‍යුහවල වාසි සහ අවාසි සඳහන් කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. එහි **(a) කොටසින්** නායකත්වයේ ප්‍රධාන කාර්යයන් 3 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබූ අතර, **(b) කොටසින්** ඒකාධිපති නායකයන් (autocratic leaders) සහ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් (democratic leaders) අතර වෙනස පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් නායකත්ව කාර්යයන් ඉදිරිපත් කළද පැහැදිලි කිරීම් දක්වා නොතිබුණි. එවැනි අයට මුළු ලකුණු ලබාගැනීමට නොහැකි විය. එමෙන්ම සමහර අයදුම්කරුවන් එකම කරුණ කාර්යයන් දෙකක් ලෙස විස්තර කර තිබුණි.

මෙහි **(b) කොටසටද** උත්තර සාර්ථකව බොහෝ අයදුම්කරුවන් ඉදිරිපත් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් දේශපාලන කෝණයෙන්ද පෙන්වා දෙමින් උත්තර සපයා තිබුණි. මේ නායකයන් පිළිබඳ වෙනස පැහැදිලි කිරීමේදී සමහර අයදුම්කරුවන් සන්සන්දනාත්මක ලෙස පැහැදිලි කිරීමක් දක්නට නොලැබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 09

අභිප්‍රේරණය පිළිබඳව ඉදිරිපත් කර තිබූ ප්‍රශ්නයක් වන මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. එහි **(a) කොටසින්** සංවිධානයක් සඳහා අභිප්‍රේරණය වැදගත්වීමට හේතු 3 ක් විමසන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. සමස්ථයක් ලෙස අයදුම්කරුවන්ගෙන් 95% ක් පමණ මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබූ අතර, ඉන් 80% ක් පමණ සංවිධානයක් සඳහා අභිප්‍රේරණය වැදගත්වීමට හේතු 3 ක් දක්වා එම කරුණු සාර්ථකව පැහැදිලි කර තිබූ බැවින් මෙම කොටසට අයත් මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වී තිබුණි. තවද උත්තර ලියා තිබූ අය අතුරින් ඇතැම් අය අභිප්‍රේරණය වැදගත්වීමට හේතු දක්වා තිබුණද එම කරුණු පැහැදිලි කර නොතිබූ අවස්ථා ද තිබුණි. ඔවුන්ට පැහැදිලි කිරීමට අදාල ලකුණු ලබාගැනීමට නොහැකි විය. එසේම හේතු 3 ක් පිළිබඳව අවබෝධයක් නොමැතිව එකම කරුණක් දීර්ඝ ලෙස සමහර අයදුම්කරුවන් විස්තර කර තිබුණි. සම්පූර්ණ වෙන්කළ ලකුණු ලබා ගැනීමට හේතු 3 ක් ලියා ඒවා කෙටියෙන් විස්තර කළ යුතු වේ.

මෙහි **(b) කොටසින්** මැක්ලෙලන්ඩ්ගේ අවශ්‍යතා අත්පත් කරගැනීමේ න්‍යාය (McClelland's Acquired Needs Theory) මගින් හඳුනාගෙන ඇති පහත සඳහන් අවශ්‍යතා පැහැදිලි කරන ලෙසට ඉදිරිපත් කර තිබුණි:

**(i)** සාධනය හෝ ජයග්‍රහණය පිළිබඳ අවශ්‍යතාවය (Need for achievement)

**(ii)** සබඳතා සඳහා ඇති අවශ්‍යතාවය (Need for affiliation)

මෙම කොටස සඳහා සාධනය පිළිබඳ අවශ්‍යතාවය සහ සබඳතා සඳහා ඇති අවශ්‍යතාවය යන න්‍යායාත්මක කරුණු දෙක පිළිබඳව අයදුම්කරුවන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති බව අනාවරණය විය. ඉතා සුළු පිරිසක් පමණක් නිවැරදිව කරුණු ඉදිරිපත්කර ලකුණු ලබාගෙන තිබුණි. ඒ අනුව මැක්ලෙලන්ඩ්ගේ අවශ්‍යතා අත්පත් කරගැනීමේ න්‍යාය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. ඇතැම් අයදුම්කරුවන් වෙනත් අදාල නොවන න්‍යායයන් හා සම්බන්ධ කරුණු ඉදිරිපත් කර තිබූ අවස්ථා ද දක්නට ලැබුණි. බොහෝ දෙනෙක් මෙම කොටස සඳහා උත්තර ලිවීම මගහැර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

<u>**D කොටස**</u>

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයකි. ඉදිරිපත් කරන ලද සිද්ධියට අදාලව න්‍යායාත්මක කරුණු ගොනුකරන ආකාරය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. (a), (b), (c) සහ (d) යනුවෙන් කොටස් 4 කින් ප්‍රශ්නය සමන්විතය.

<u>**(a) කොටස**</u>

මෙම කොටසින් සිද්ධියට අදාල සමාගමේ සඵලදායී සැළසුම්කරණය සඳහා ඇති බාධක 4 ක් පැහැදිලි කරන ලෙස දන්වා තිබුණි. මෙහිදී සිද්ධියට අදාලව ඉදිරිපත් කර ඇති සමාගමේ සැලසුම්කරණය පිළිබඳ අවබෝධයක් ලබාගෙන ඒ සඳහා ඇති සාධක 4 ක් සඳහන් කර ඒවා එකින් එක පැහැදිලි කළ යුතුව තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා සාර්ථක උත්තර ඉදිරිපත් කර නියමිත ලකුණු ලබා ගැනීමට සමත් විය. ඇතැම් අය සැළසුම්කරණයට අදාල බාධා නම්කර තිබුණ ද, සිද්ධිය ඇසුරෙන් ඒවා පැහැදිලි කර, නොතිබුණි. එහිදී පැහැදිලි කිරීම සඳහා වෙන්කරන ලද ලකුණු ලබාගැනීමට නොහැකි වී තිබුණි.

<u>**(b) කොටස**</u>

මෙම කොටසින් සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී බාධක මැඩ පැවැත්වීම සඳහා (overcome) ක්‍රම 3 ක් සඳහන් කරන ලෙස විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා නියමිත ලකුණු ලබාගෙන තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ඉතා දීර්ඝ ලෙස විස්තර කර ලියා තිබුණි. ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූයේ සඳහන් කිරීම පමණි.

**(c) කොටස**

මෙම කොටසින් සමාගමේ වෙනස් වීමට ඇති බාධා මැඩ පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ගතහැකි ක්‍රියාමාර්ග 3 ක් විමසීම අපේක්ෂා කර තිබුණි. මේ සඳහාද සාර්ථක උත්තර බහුතරයක් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් බාධා මැඩ පැවැත්වීමට ගතහැකි ක්‍රියාමාර්ග සඳහන් කිරීම පමණක් කර එය සිද්ධියට අදාලව විමසීම් කර නොතිබුණි.

**(d) කොටස**

මෙම කොටසින් දී ඇති සමාගම අදාල කර ගනිමින් "වටිනාකම් දාමයේ" (Value Chain) මූලික ක්‍රියාකාරකම් 4 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙම කොටස සඳහාද සමස්ථයක් වශයෙන් උත්තර සැපයීම දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටස සඳහා උත්තර ඉදිරිපත් කිරීම මගහැර තිබුණි. එයින් පෙනී යන්නේ වටිනාකම් දාමය පිලිබඳව අවබෝධයක් නොමැති බවයි. ඇතැම් අය වටිනාකම් දාමයේ මූලික ක්‍රියාකාරකම් නම්කර තිබුණ ද සිද්ධිය අදාල කරගනිමින් පැහැදිලි කිරීම් කර නොතිබුණි. එවැනි අයට ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ලබාගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක විය.**

\- \- \-

**අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරික්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැළකිලිමත් විය යුතුය.

(8) ඒඒටී ආයතනය මගින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

\- * * * -